# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2353/57 - 2023 ඔක්තෝබර් මස 13 වැනි සිකුරාදා - 2023.10.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/3/6/2/22.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2010/D/308.

ශ්‍රී ලංකා යුධ හමුදාවේ 8 වන ගජබා රෙජිමේන්තුව ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හලංගොඩ ග්‍රාම නිලධාරි වසමේ පන්සලාතැන්න ගමේ පිහිටි මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක 310507 කැඩැස්තර සිතියමෙහි පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල:

1. **කැබලි අංක 03**
හිමිකම් කියන්නා : ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 21, බී.සී.සී. පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12; ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 6.3048

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.11.27 දින පෙරවරු 10.00 ට උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2023.11.19 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

එස්. එන්. කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2023 සැප්තැම්බර් මස 27 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0162

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DEV/LND/02/ACQUI/09-2(3).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/14/2021/FH/20.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය ඇතුළත් 2332/35 හා 2023.05.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

1A - G 040530 – 19 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර යටතේ, දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දර මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ මාතර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක 820308 දරන කැඩැස්තර සිතියමේ, යන්න "අංක 820310 දරන කැඩැස්තර සිතියම" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩී. පී. ලියන පටබැඳි,
ප්‍රාදේශීය ලේකම් හා
අත්කර ගැනීමේ නිලධාරි,
දෙව්නුවර.

2023 ඔක්තෝබර් මස 11 වැනි දින,
දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.